**කැබිනට් පත්‍රිකාව**

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව**

**1975 අංක 1 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත සඳහා සංශෝධන**

**පසුබිම**:

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව පිහිටවනු ලැබෙන්නේ, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිෂන් සභා පනත යටතේ 1994 වසරේදී ය. මෙම පනත, (a) 1954 අංක 11 දරණ අල්ලස් පනත සහ (b) 1975 අංක 1 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ, අල්ලස් හෝ දූෂණ විමර්ෂණය කිරීමට හා චෝදනා ගොනු කිරීමට කොමිෂන් සභාව වෙත බලය ලබා දෙයි.

**ක්‍රියාකාරීත්වය**:

වඩා ඵලදායී ලෙස අල්ලස් හා දූෂණ විමර්ෂණය කිරීමට හා චෝදනා ගොණු කිරීමට බාධා කරන වගන්ති දැනට ක්‍රියාත්මක 1975 අංක 1 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත තුළ වෙයි. එම වගන්ති 1975 අංක 1 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතෙහි අභිලාෂයට බාධාවකි.

i) නීතිපතිවරයාගේ අනුමැතිය නොමැතිව නඩුවක් ගොණු කිරීමට නොහැකි බව සඳහන් කරමින්, 12(1) වගන්තිය ප්‍රකාරව අල්ලස් හා දූෂණ විමර්ෂණ කොමිෂන් සභාව වෙත ලබා දී ඇති බලය අවප්‍රමාණ කිරීම

ii) වගන්ති කිහිපයකදීම අල්ලස් හා දූෂණ විමර්ෂණ කොමිෂන් සභාව පිළිබඳ සඳහන් නොකිරීම

iii) තව දුරටත් නොපවතින ආයතන සහ වැටුප් පරිමාණ පිළිබඳ සඳහන් කිරීම

iv) පනතෙහි විධිවිධාන පූරණය නොකරන පුද්ගලයින් සඳහා ප්‍රමාණවත් නොවන දඩ මුදල් ඇතුලත්ව තිබීම

v) පනත යටතේ තොරතුරු අනාවරණය කරන ලද පුද්ගලයින් වෙත දඬුවම් පැනවීම

**අවශ්‍ය නිර්දේශ හා යොමුකිරීම**:

එබැවින්, අත්‍යාවශ්‍ය කටයුත්තක් ලෙස ගනිමින්, 1975 අංක 1 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත සඳහා අවශ්‍ය සංශෝධන වහාම ඉදිරිපත් කිරීම සඳහා පියවර ගැනීමට කැබිනට් අමාත්‍යවරුන් මෙමගින් යොමු කෙරේ. මෙම සංශෝධන හේතුවෙන් වඩාත් ඵලදායී හා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක වීමටත්, අබාධිත සඳහන් සහ අසංගතතාවන් ඉවත්කිරීම හේතුවෙන් පැහැදිලි ලෙස ක්‍රියාත්මක වීමටත්, කොමිෂන් සභාවට ඉඩ සැළසෙනු ඇත.

**නිර්දේශ**:

i) පනත යටතේ කොමිෂන් සභාව මගින් සෘජුව නඩු පැවරීමේ හැකියාව අහිමි කරන 1975 අංක 1 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතෙහි 9 (5) වගන්තිය ඉවත් කිරීම

ii) පනතෙහි 5 (2) වගන්තිය, 6 වගන්තිය, 7(6) වගන්තිය සහ 9(1)(c) වගන්තිය සඳහා අල්ලස් හා දූෂණ විමර්ෂණ කොමිෂන් සභාව වෙනුවට 'අල්ලස් කොමසාරිස්වරයා' යන්න යෙදීම

iii) තව දුරටත් නොපවතින හෙයින් 'සංවර්ධන සභා' සහ 1932 අංක 17 දරණ සමාගම් පනත යන සඳහන් පනතින් ඉවත් කිරීම

iv) 'පළාත් සභා' සහ 2007 අංක 7 දරණ සමාගම් පනත යන සඳහන් පනතට ඇතුළත් කිරීම

v) පනතෙහි අංක 9 දරණ වගන්තිය යටතේ වන උපරිම දඩ මුදල (එනම් රුපියල් 1000/-) ඉහළ නැංවීම

vi) පනතට අනුකූලව තොරතුරු ලබාගත් හෝ අනාවරණය කරගත් පුද්ගලයින් වෙත දඬුවම් පැමිණවිය හැකි, 1975 අංක 1 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතෙහි 7 (4) වගන්තිය, 7 (5) වගන්තිය සහ 8 වගන්තිය ඉවත් කිරීම

1975 අංක 1 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත සඳහා මෙහි සඳහන් සංශෝධන කැබිනට් මණ්ඩලය වෙත මෙයින් නිර්දේශ කෙරෙනු ඇත.

ජනාධිපති ලේකම් කාර්යාලයේදී ය

**මෛත්‍රීපාල සිරිසේන**
**ජනාධිපති**

2015, නොවැම්බර් ........

## වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත (සංශෝධන)

## 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීති සඳහා සංශෝධන සහිත පනත

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් පහත පරිදි බලාත්මක කෙරෙනු ඇත:-

[දිනය, 2015]

කෙටි නාමය.

**1.** මෙම පනත, 2015 අංක .... දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ (සංශෝධිත) පනත ලෙස සඳහන් කෙරෙනු ඇත.

1975 අංක 1 දරන පනතෙහි 2(1)(da) සහ 2(1)(dc) වගන්ති සඳහා සංශෝධන.

**2.** 1988 අංක 74 දරන පනත මගින් සංශෝධනය කරන ලද, 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතෙහි (මින් ඉදිරියට "මූලික කෙටුම්පත" ලෙස සඳහන් කෙරෙනු ඇත.) සඳහන් 2(1)(da) සහ 2(1)(dc) යන වගන්ති මෙමගින් අවලංගු වන අතර ඒ සඳහා පහත සඳහන් වගන්ති ආදේශ කෙරේ: -

මෙම නීතිය භාවිතා කිරීම.

මෙම නීතියේ සඳහන් විධිවිධාන පහත සඳහන් කණ්ඩායම් හෝ විස්තරකිරීම්වලින් ඕනෑම කොටසක් යටතට ගැනෙන ඕනෑම පුද්ගලයකුටම අදාල ය.

(da) 1981 අංක 15 දරන ජනාධිපතිවරණ මැතිවරණ පනත, 1981, අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත හෝ 1998 අංක 2 දරන පළාත් සභා මැතිවරණ පනත හෝ වෘත්තීය සමිති ආඥා පනත යටතේ මැතිවරණ ඡන්ද කටයුතු සඳහා පිළිගත් දේශපාලන පක්ෂවල නිලතල දරන කාර්යමණ්ඩල සාමාජිකයින්.

(dc) 1981 අංක 15 දරන ජනාධිපතිවරණ මැතිවරණ පනත, 1981, අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත හෝ 1998 අංක 2 දරන පළාත් සභා මැතිවරණ පනත හෝ වෘත්තීය සමිති ආඥා පනත යටතේ මැතිවරණවලදී ඡන්දය ඉල්ලීම සඳහා තේරී පත් වුණු තරගකරුවන්.

| | |
|---|---|
| 1975 අංක 1 දරන පනතෙහි 2(1)(de) වගන්තිය සඳහා සංශෝධන | **3**. 1988 අංක 74 දරන පනත මගින් සංශෝධනය කරන ලද මූලික කෙටුම්පතෙහි 2(1)(de) වගන්තිය මෙමගින් අවලංගු වන අතර ඒ සඳහා පහත සඳහන් වගන්තිය ආදේශ කෙරේ: - |

| | |
|---|---|
| මෙම නීතිය භාවිතා කිරීම | මෙම නීතියේ සඳහන් විධිවිධාන පහත සඳහන් කණ්ඩායම් හෝ විස්තරකිරීම්වලින් ඕනෑම කොටසක් යටතට ගැනෙන සෑම පුද්ගලයකුටම අදාල ය.<br><br>(de) 2007 දරන අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කොට ඇති, බහුතර කොටස් සඳහා රජය හෝ රජයේ සංස්ථා හිමිකාරිත්වය දරන සමාගම්වල සභාපති, අධ්‍යක්ෂක සහ මාණ්ඩලික නිලධාරීන්. |

| | |
|---|---|
| 1975 අංක 1 දරන පනතෙහි 4(ia) වගන්තිය සඳහා සංශෝධන | **4.** 1988 අංක 74 දරන පනත මගින් සංශෝධනය කරන ලද මූලික කෙටුම්පතෙහි 4(ia) වගන්තිය මෙමගින් අවලංගු වන අතර ඒ සඳහා පහත සඳහන් වගන්තිය ආදේශ කෙරේ: - |

| | |
|---|---|
| වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයන් ඉදිරිපත් කළ යුත්තේ කවුරුන් වෙත ද? | වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයන් ඉදිරිපත් කළ යුත්තේ පහත සඳහන් පරිදි ය: |

(ia) මැතිවරණ කොමසාරිස්වරයා වෙත

(i) 1981 අංක 15 දරන ජනාධිපතිවරණ මැතිවරණ පනත, 1981, අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත හෝ 1988 අංක 2 දරන පළාත් සභා මැතිවරණ පනත හෝ වෘත්තීය සමිති ආඥා පනත යටතේ මැතිවරණ ඡන්ද කටයුතු සඳහා පිළිගත් දේශපාලන පක්ෂවල නිලතල දරන කාර්යමණ්ඩල සාමාජිකයින්.

(ii) 1981 අංක 15 දරන ජනාධිපතිවරණ මැතිවරණ පනත, 1981, අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත හෝ 1998 අංක 2 දරන පළාත් සභා මැතිවරණ පනත හෝ වෘත්තීය සමිති ආඥා පනත යටතේ මැතිවරණවලදී ඡන්දය ඉල්ලීම සඳහා තේරී පත් වුණු තරගකරුවන්.

1975 අංක 1 දරන පනතෙහි 4(id) වගන්තිය සඳහා සංශෝධන.

**5.** 1988 අංක 74 දරන පනත මගින් සංශෝධනය කරන ලද මූලික කෙටුම්පතෙහි 4(id) වගන්තිය මෙමගින් අවලංගු වන අතර ඒ සඳහා පහත සඳහන් වගන්තිය ආදේශ කෙරේ: -

වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයන් ඉදිරිපත් කළ යුත්තේ කවුරුන් වෙත ද?

වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයන් ඉදිරිපත් කළ යුත්තේ පහත සඳහන් පරිදි ය:

(id) 2007 දරන අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කොට ඇති, බහුතර කොටස් සඳහා රජය හෝ රජයේ සංස්ථා හිමිකාරිත්වය දරන සමාගම්වල සභාපති, අධ්‍යක්ෂක සහ මාණ්ඩලික නිලධාරීන්, සමාගම් රෙජිස්ටාර්වරයා වෙත.

1975 අංක 1 දරන පනතෙහි 5(2) වගන්තිය සඳහා සංශෝධන.

**6.** 1988 අංක 74 දරන පනත මගින් සංශෝධනය කරන ලද මූලික කෙටුම්පතෙහි 5(2) වගන්තිය මෙමගින් අවලංගු වන අතර ඒ සඳහා පහත සඳහන් වගන්තිය ආදේශ කෙරේ: -

වත්කම් හා බැරකම් ප්‍රකාශ පරීක්ෂා කිරීමේ බලය.

නීතිපතිවරයා, අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිෂන් සභාව, දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල්වරයා, සහ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා යන අයට ඕනෑම වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයක් කැඳවීමටත් පරීක්ෂා කිරීමටත් බලය හිමි ය.

1975 අංක 1 දරන පනතෙහි 6 වගන්තිය සඳහා සංශෝධන.

**7.** 1988 අංක 74 දරන පනත මගින් සංශෝධනය කරන ලද මූලික කෙටුම්පතෙහි 6 වගන්තිය මෙමගින් අවලංගු වන අතර ඒ සඳහා පහත සඳහන් වගන්තිය ආදේශ කෙරේ: -

අල්ලස් කොමසාරිස්වරයාට ඇති අමතර තොරතුරු ඉල්ලා සිටීමේ බලය.

මෙම නීතිය යටතේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇති ඕනෑම පුද්ගලයකුගෙන්, මෙම පනතෙහි සඳහන් නීතිය යටතේ ප්‍රකාශ වන කාර්යයන් ඉටු කිරීම පිණිස, ඕනෑම මොහොතක, අමතර තොරතුරු ඉල්ලා සිටීමට අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිෂන් සභාවට හැකි ය.

1975 අංක 1 දරන පනතෙහි 7 (6) වගන්තිය සඳහා සංශෝධන.

**8.** 1988 අංක 74 දරන පනත මගින් සංශෝධනය කරන ලද මූලික කෙටුම්පතෙහි 7 (6) වගන්තිය මෙමගින් අවලංගු වන අතර ඒ සඳහා පහත සඳහන් වගන්තිය ආදේශ කෙරේ: -

ඕනෑම පුද්ගලයකු විසින් සිදු කරන ලිඛිත සන්නිවේදනය පිළිබඳ පටිපාටිය සහ ප්‍රසිද්ධ ප්‍රකාශ තහනම

මෙම වගන්තියෙහි දී “නිසි බලධරයා” යනුවෙන් අදහස් කෙරෙන්නේ නීතිපතිවරයා, අල්ලස් හෝ දූෂණ විමර්ශණ කොමිෂන් සභාව, දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල්, විනිමය පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා සහ ප්‍රධාන රේගු බදු එකතුකරන්නා යන අයවළුන් ය.

1975 අංක 1 දරන පනතෙහි 9 (1) වගන්තිය සඳහා සංශෝධන.

**9.** 1988 අංක 74 දරන පනත මගින් සංශෝධනය කරන ලද මූලික කෙටුම්පතෙහි 9 (1) වගන්තිය මෙමගින් අවලංගු වන අතර ඒ සඳහා පහත සඳහන් වගන්තිය ආදේශ කෙරේ: -

වැරදි.

යම් තැනැත්තෙක්:-

(a) අංක 3 වගන්තිය යටතේ ඉදිරිපත් කළ යුතු වත්කම් හා බැරකම් ප්‍රකාශය කිසිදු පිළිගත හැකි හේතුවකින් තොරව ඉදිරිපත් කිරීමට අසමත් වන්නේ නම්; හෝ

(b) ප්‍රකාශයකදී යම් සාවද්‍ය තොරතුරක් ඉදිරිපත් කර ඇත්නම්; හෝ

(bb) යම් වත්කමක් හෝ බැරකමක් පිළිබඳ සඳහන් කිරීම සිතාමතා මගහැර තිබෙන්නේ නම්; හෝ

(c) පිළිගත හැකි හේතුවකින් තොරව, මෙම නීතිය යටතේ අල්ලස් හෝ දූෂණ විමර්ශණ කොමිෂන් සභාව ඉල්ලා සිටින අමතර තොරතුරු සැපයීමට අසමත් වන්නේ නම්; හෝ

(d) වෙනත් මොනයම් හෝ ආකාරයකින් මෙම පනතෙහි විධිවිධාන උල්ලංඝණය කරන්නේ නම්

වරදක් සිදු කරන ලද්දෙකු බවට සැළකිය හැකි අතර, එම තැනැත්තා මහේස්ත්‍රාත්වරයකු හමුවට පමුණුවා සිදුකරන නඩු විභාගයකින් පසු, රුපියල් දසදහස නොඉක්මවූ දඩයක් ගෙවීමට නියම කිරීමට හෝ නොඑසේනම් වසරක් නොඉක්මවූ සිර දඬුවමක් නියම කිරීමට හෝ දඩ මුදල සහ සිර දඬුවම යන දෙකටම යටත් කිරීමට හෝ හැකියාවක් ඇත.

1975 අංක 1 දරන පනතෙහි 7 (4) වගන්තිය අවලංගු කිරීම.

**10.** 1988 අංක 74 දරන පනත මගින් සංශෝධනය කරන ලද මූලික කෙටුම්පතෙහි 7 (4) සහ 7 (5) වගන්ති මෙමගින් අවලංගු කෙරේ.

1975 අංක 1 දරන පනතෙහි 8 වගන්තිය අවලංගු කිරීම.

**11.** 1988 අංක 74 දරන පනත මගින් සංශෝධනය කරන ලද මූලික කෙටුම්පතෙහි 8 වගන්තිය මෙමගින් අවලංගු කෙරේ.

1975 අංක 1 දරන පනතෙහි 9 (5) වගන්තිය අවලංගු කිරීම.

**12.** 1988 අංක 74 දරන පනත මගින් සංශෝධනය කරන ලද මූලික කෙටුම්පතෙහි 9 (5) වගන්තිය මෙමගින් අවලංගු කෙරේ.

මූලික කෙටුම්පතෙහි 12 වන වගන්තිය සඳහා සංශෝධන.

**13.** 1988 අංක 74 දරන පනත මගින් සංශෝධනය කරන ලද මූලික කෙටුම්පතෙහි 12 වගන්තියෙහි එන ''පළාත් පාලන ආයතන'' යනුවෙන් අදහස් කරන අර්ථ දැක්වීම අවලංගු කරමින් ඒ සඳහා පහත සඳහන් නව අර්ථ ගැන්වීම ආදේශ කෙරේ:

> "පළාත් පාලන ආයතන" යන යෙදුමෙන් ඕනෑම මහනගර සභාවක්, නගර සභාවක්, පළාත් සභාවක්, ප්‍රාදේශීය සභාවක් සහ භාවිත නීතිය මගින් ඇති කරන සහ පිහිටුවනු ලබන, බලතල ක්‍රියාත්මක කරන හා කාර්ය හා කර්තව්‍යයන් ඉෂ්ට කරනු ලබන එවැනි ඕනෑම සභාවක්;

අපැහැදිලි අවස්ථාවක දී සිංහල පිටපත බල පැවැත්විය යුතු ය.

**14.** සිංහල හා දමිළ පිටපත් අතර යම් අපැහැදිලිතාවක් පැන නගින අවස්ථාවකදී සිංහල පිටපත බල පැවැත්විය යුතු ය.